# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2021.12.15

වර්ෂ 2021 ක් වූ දෙසැම්බර් මස 15 වන බදාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ දෙසැම්බර් මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**<u>මහා සභා රැස්වීම ආරම්භ වන විට සහභාගී වූ ගරු සභිකවරු</u>**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
03. ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
08. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
09. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
10. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා විසින් මහා සභා රැස්වීමේ වාර්තා තබන ලදී.

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම ඃ-</u>**

**<u>01. 2021-11-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් 2021-11-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලෙසත්, මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත්, මහා සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත් සභාව වෙතින් ඉල්ලීම් කරන ලදී.

2021-11-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් 2021-11-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සඳහා සංශෝධන (උපලේඛන 01) ලිඛිතව ඉදිරිපත්කොට ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

2021-11-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

<u>(ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සහ ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)</u>

**<u>02. 2021-11-19 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් 2021-11-19 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලෙසත්, විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත්, විශේෂ මහා සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත් සභාව වෙතින් ඉල්ලීම් කරන ලදී.

2021-11-19 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් 2021-11-19 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සඳහා සංශෝධන (උපලේඛන 02) ලිඛිතව ඉදිරිපත්කොට ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

2021-11-19 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

අයහපත් කාළගුණ තත්ත්වය නිසා කලේගාන වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු හා සිට්ට්‍රස්වත්ත ආදාහනාගාරයේ ඉදිකිරීම් කටයුතු අඩාල වී ඇති බවත්, කාබනික පොහොර සහන මිලට ලබාදීමේ ව්‍යාපෘතිය මේ වනවිට ආරම්භකොට ඇති බවත්, රු.200.00ක සහන මිලට කිලෝ 25ක කාබනික පොහොර මලු කලේගාන ප්‍රධාන කාර්යාලයෙන් සහ මීපාවල උප කාර්යාලයෙන් මිලදීගත හැකි බවත්, එක් අයෙකුට කාබනික පොහොර මලු පහක උපරිමයක් දක්වා මිලදී ගැනීමේ හැකියාව ඇති බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ- නැත**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ- නැත**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**01.** 2022 වර්ෂය සඳහා කාරක සභා පත්කිරීමට යෝජනා කරමි.

I. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

II. තාක්ෂණික සේවා කමිටුව

III. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව

IV. පරිසරය සහ පහසුකම් කමිටුව

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පසුගිය වර්ෂයේ පැවති පරිදිම කාරක සභා සඳහා සාමාජිකයන් පත් කරන ලෙසත්, හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. එන්. කියාස් මැතිතුමා වෙනුවට ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමාව තාක්ෂණික සේවා කමිටුවට නම් කරන ලෙසත්, ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් පහත පරිදි කාරක සභා සඳහා සභිකයින් නම් කරන ලදී.

**I. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
04. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
07. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
08. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
09. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**II. තාක්ෂණික සේවා කමිටුව**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
04. ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
06. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
08. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
09. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**III. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
03. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
04. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
06. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
07. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
08. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
09. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**IV. පරිසරය සහ පහසුකම් කමිටුව**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
04. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
06. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
08. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
09. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව විසින් ගනු ලබන තීරණවල වගකීම එම කමිටුවටම පවරන ලෙසත්, එම වගකීම සභාවට නොපැවරෙන පරිදි කටයුතු කරන ලෙසත්, ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සහ ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

පසුගිය දිනක ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පැවති බවත්, එහිදී ගරු ආණ්ඩුකාරතුමා විසින් සාධාරණ තීන්දු සඳහා අධිභාරවලට ලක්වුවහොත් ඒ සඳහා ඉඩ නොතබන බවට ප්‍රකාශ කළ බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගරු ආණ්ඩුකාරතුමාගේ එවැනි ප්‍රකාශ නිසා ප්‍රාදේශීය සභාවල් අත්තනෝමතික ලෙස ක්‍රියාකරන බව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අධිභාරවලට යාමේදී එහි වගකීම සභිකවරුන් විසින් දරා ගත යුතු බවත්, මෙම සභාවේ හිටපු මන්ත්‍රීවරු නමදෙනෙක් වීදුරු මිලදී ගැනීම සම්බන්ධව අධිභාර ගෙවූ බවත්, එය එම සභාවාරයෙන් පසුව කාලයකදී ගෙවීමට සිදු වූ බවත්, මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවෙන් තමා ඉල්ලා අස්වන බවත් ප්‍රාදේශීය සභා

පනතේ නීති අනුව වැඩ කටයුතු කළ යුතු බවත්, ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවට ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා වෙනුවට ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමාගේ නම ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් යෝජනා කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද දෙවන යෝජනාව ඉල්ලා අස්කර ගන්නා ලදී.

**03.** 2022 වර්ෂය සඳහා රු. 200,000.00 ට වැඩි වියදම් දැරීමේ බලතල මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවට පැවරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**සංශෝධන :-** 2022 වර්ෂය සඳහා සියළුම වියදම් දැරීමේ බලතල මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවට පැවරීමට යෝජනා කරමි.

ඉහත සංශෝධනය ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉදිරි වර්ෂයේදී මිලදී ගැනීම් කටයුතුවලදී යම් ප්‍රමාදයක් ඇති විය හැකි බවත්, අනවශ්‍ය බලයක් තමා වෙත ලබා ගැනීමට අවශ්‍ය නොවන නිසා මෙම තීරණය ලබා ගත් බව මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව මේ නිසා ඉක්මනින් කැඳවීමට සිදු වන බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** 2022 වර්ෂය සඳහා වැටුප් හා දීමනා ගෙවීම් අනුමත කිරීමේ බලතල ගරු සභාපතිතුමාට පැවරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**සංශෝධන :-** 2022 වර්ෂය සඳහා වැටුප් හා දීමනා ගෙවීම් අනුමත කිරීමේ බලතල 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 216 දරණ වගන්තිය අනුව ගරු සභාපතිතුමාගේ පොදු පාලනයට යටත්ව ලේකම් වෙත පැවරීමට යෝජනා කරමි.

ඉහත සංශෝධනය ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** 2022 වර්ෂය සඳහා අප ප්‍රාදේශිය සභාවේ රු. 200,000.00 ට අඩු අනෙකුත් ගෙවීම් අනුමත කිරීමේ බලතල ගරු සභාපතිතුමාට පැවරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**සංශෝධන :-** 2022 වර්ෂය සඳහා අප ප්‍රාදේශිය සභාවේ රු. 200,000.00 ට අඩු අනෙකුත් ගෙවීම් අනුමත කිරීමේ බලතල 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 216 දරණ වගන්තිය අනුව ගරු සභාපතිතුමාගේ පොදු පාලනයට යටත්ව ලේකම් වෙත පැවරීමට යෝජනා කරමි.

ඉහත සංශෝධනය ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**06.** 2022 වර්ෂය සඳහා රු. 200,000.00 ට වැඩි අනෙකුත් ගෙවීම් අනුමත කිරීමේ බලතල මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවට පැවරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** 2022 වර්ෂය සඳහා ටෙන්ඩර් මණ්ඩල බලතල මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවට පැවරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**08.** 2022 වර්ෂය සඳහා ගිණුම් අතර මුදල් මාරු කිරීමේ බලතල මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවට පැවරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**09.** 2022 වර්ෂය සඳහා කර්මාන්ත ඇස්තමේන්තු අනුමත කිරීමේ බලතල තාක්ෂණික සේවා කමිටුවට පැවරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**10.** 2022 වර්ෂය සඳහා නිවාස හා ප්‍රජා සංවර්ධන විෂයන් සම්බන්ධව සේවා අවශ්‍යතාවය මත තීන්දු තීරණ ගැනීමේ බලතල නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව වෙත පැවරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව 2021 වර්ෂයේදී රැස්වූයේ නැති බවත්, මෙම කමිටුව හරහා ඵලදායි සේවයක් ඉටු විය යුතු බවත් ප්‍රකාශ කරන ලද ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ගම්වල ජීවත්වන අහිංසක මිනිසුන් හට නිවාස තනා දීම මෙම කමිටුව හරහා සිදු කිරීමට හැකියාවක් තිබේද යනුවෙනුත්, මෙම කමිටුව හරහා සිදු කළ හැකි බව කාර්යයන් මොනවාද යනුවෙනුත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

යෝජනා ඉදිරිපත් නොවීම හේතුවෙන් එම කමිටුව කැඳවීම සිදු නොකළ බවත්, මධ්‍යම රජයේ තීන්දු මත නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන විට මෙම කමිටුව හරහා පොදු තීන්දුවක් ලබා ගත හැකි බවත්, ඊට අමතරව මුළු බලප්‍රදේශයම ආවරණය වන පරිදි තීරණ ලබා ගෙන ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ක්‍රියාත්මක කළ හැකි බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

සෑම වසරකදීම තමාගේ ප්‍රධානත්වයෙන් කපුහෙම්පල කොට්ඨාශයේ නිවසක් ඉදිකරන බවත්, ඒ සඳහා මෙම කමිටුව හරහා සභාවේ දායකත්වය ලබා දීම මඟින් ගොඩනැගිලි ද්‍රව්‍ය, ශ්‍රමය, විදුලිය, ජලය ලබා දීමේ හැකියාවක් මෙම කමිටුවට ඇති බව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සභා අරමුදලේ ප්‍රමාණය අනුව එය තීරණය වන බවත්, පසුගිය වර්ෂයේදී සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන තිහක් සභා අරමුදලින් වෙන් කළද, ඉදිරි වර්ෂයේදී සංවර්ධන කටයුතු සඳහා වෙන් කළ හැකි වූයේ රුපියල් මිලියන විස්සක් පමණක් බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

සභාවක් ලෙස පරිත්‍යාගශීලීන් සම්බන්ධ කර ගනිමින් මෙම කාර්යයන් සිදු කළ හැකි බවත්, අඩුපාඩු සහිත නිවාස බලප්‍රදේශය තුල ඇති බැවින්, එම නිවාස ඉදිකර ගැනීමට දායකත්වය ලබා දීම සම්බන්ධව පෞද්ගලිකව මැදිහත්වීම සිදු කරන ලෙස ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**11.** 2022 වර්ෂය සඳහා පරිසරය සහ පහසුකම් විෂයන් සම්බන්ධව සේවා අවශ්‍යතාවය මත තීන්දු හා තීරණ ගැනීමේ බලතල පරිසරය සහ පහසුකම් කමිටුව වෙත පැවරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**12.** 2022 වර්ෂය සඳහා කාරක සභා සතු බලතල සේවා අවශ්‍යතාවය මත අදාළ කාරක සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ක්‍රියාත්මක කිරීමට ගරු සභාපතිතුමා වෙත බලතල පැවරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**13.** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 170 වගන්තිය ප්‍රකාරව මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව 2021-10-15 වන දින පහත සඳහන් වැය ශීර්ෂයන් අතර මුදල් මාරුකර තිබීම අනුමත කරන මෙන් යෝජනා කරමි.

| **ඌනතා වූ වැය විෂයන්** | | | **අතිරික්ත වූ වැය විෂයන්** | | |
|---|---|---|---|---|---|
| **වැය සංකේතය** | **වැය විෂය** | **වටිනාකම** | **වැය සංකේතය** | **වැය විෂය** | **වටිනාකම** |
| 505-3-2 | වෙනත් ආවශ්‍යක සේවා - ජලය | රු.20,000.00 | 603-1 | සැපයුම් ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | රු.20,000.00 |

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**14.** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 170 වගන්තිය ප්‍රකාරව මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව 2021-11-16 වන දින පහත සඳහන් වැය ශීර්ෂයන් අතර මුදල් මාරුකර තිබීම අනුමත කරන මෙන් යෝජනා කරමි.

| **ඌනතා වූ වැය විෂයන්** | | | **අතිරික්ත වූ වැය විෂයන්** | | |
|---|---|---|---|---|---|
| **වැය සංකේතය** | **වැය විෂය** | **වටිනාකම** | **වැය සංකේතය** | **වැය විෂය** | **වටිනාකම** |
| 101-9 | වෙනත් දීමනා | රු.860,000.00 | 301-9 | වෙනත් දීමනා | රු.860,000.00 |
| 105-3-1 | වෙනත් ආවශ්‍යක සේවා විදුලිය | රු.40,000.00 | 302-1 | ගමන් වියදම් | රු.40,000.00 |
| 301-1 | වැටුප් හා දීමනා | රු.1,250,000.00 | 201-1 | වැටුප් හා දීමනා | රු.1,250,000.00 |
| 304-2-1 | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තු | රු.300,000.00 | 303-2 | ඉන්ධන හා ස්නේහක තෙල් | රු.300,000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 601-1 | වැටුප් හා දීමනා | රු.300,000.00 | 501-1 | වැටුප් හා දීමනා | රු.300,000.00 |
| 601-9 | වෙනත් දීමනා | රු.75,000.00 | 501-9 | වැටුප් හා දීමනා | රු.75,000.00 |

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**15.** ප්‍රාදේශීය සභාවේ උත්සව සහ අනෙකුත් විශේෂ අවස්ථා වලදී භාවිතා කිරීම සඳහා අඩි 10 x අඩි 20 ප්‍රමාණයේ නව සමර් හට් 05ක් මිලදී ගැනීමටත් සභාව සතු සමර් හට් අළුත්වැඩියාකොට ඒ සඳහා නව රෙදි මිලදී ගැනීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**16.** ප්‍රාදේශීය සභාවේ උත්සව සහ ප්‍රචාරණ කටයුතුවලදී භාවිතා කිරීම සඳහා ට්‍රැවල් ස්පීකර් පද්ධතියක් මිලදී ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**17.** ප්‍රාදේශීය සභාව වෙත පැමිණෙන මහජනතාව සහ අනෙකුත් අමුත්තන් වෙත සංග්‍රහ කිරීමේ කටයුතු සඳහා නෙස්කැෆේ මැෂින් එකක් සහ ඒ සඳහා අවශ්‍ය අනෙකුත් ද්‍රව්‍ය මිලදී ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු උප සභාපතිතුමාගේ අදහසක් අනුව මෙම යෝජනාව තමා විසින් ඉදිරිපත් කළ බවත්, මහජන දිනය වන සඳුදා දිනයේදී ප්‍රාදේශීය සභාව වෙත පැමිණෙන මහජනතාවට සංග්‍රහ කිරීමට කටයුතු කිරීමට බලාපොරත්තුවන බවත්, ඉදිරියේදී අනෙකුත් දිනවලදී ද ප්‍රාදේශීය සභාව වෙත පැමිණෙන මහජනතාව වෙත සංග්‍රහ කිරීම සඳහා බලාපොරොත්තු වන බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**18.** හපුගල ග්‍රාම සේවා වසමේ, හපුගල ආරච්චිකන්ද සුභ සාධක සමිතිය සතු පර්චස් 04.3ක් විශාලත්වයකින් යුතු ඉඩම අප ප්‍රදේශීය සභාවට තෑගි කිරීමට බලාපොරොත්තු වන බැවින් ඒ සඳහා වැයවන නීතිඥ ගාස්තු හා අනෙකුත් වියදම් සහා අරමුදලින් වියදම් දැරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

හපුගල ග්‍රාම නිලධාරි වසම සඳහා සේවා පියසක අවශ්‍යතාවය ඇති බවත්, ඉදිරියේදී මෙම ඉඩම සභාවට පවරා ගෙන ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීම පරිදි සේවා පියසක් ඉදිකිරීමට කටයුතු කරන බවත්, මෙම ඉඩම ප්‍රාදේශීය සභාවට පැවරීමේදී වැය වෙන නීතිඥ ගාස්තු සහ අනෙකුත් වියදම් ගෙවීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

එම ඉඩමේ විශාලත්වය කොපමණද යන්න ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

එම ඉඩමේ විශාලත්වය පර්චස් 4.03 ක් බවත්, එම ඉඩමේ දැනට පවතින ගොඩනැගිල්ල අළුත්වැඩියා කොට සේවා පියසක් ආරම්භ කරන බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

**19.** වීදි පහන් නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය වොට් 150 එල්.ඊ.ඩී ක්‍රෝබා වීදි පහන් කට්ටල 150ක් සහ සාමාන්‍ය වීදි පහන් කට්ටල 300ක් මිලදී ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

දැනට අළුත්වැඩියා කිරීමට ඇති ටියුබ් ලයිට් සහිත වීථි පහන් කට්ටල අළුත්වැඩියා කිරීම සිදු නොකරන බවත්, ඒ සඳහා එල්.ඊ.ඩී. බල්බ් සහිත වීථි පහන් කට්ටල සවි කිරීමට බලාපොරොත්තු වන බවත්, ටියුබ් ලයිට් සහිත වීථි පහන් කට්ටල නඩත්තු කිරීම සඳහා ගත වන කාලය සහ වියදම සළකා බැලූ විට එය ලාභදායක බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**20.** දෛනිකව අප ප්‍රාදේශීය සභාව විසින් එකතු කරනු ලබන දිරන කසළ උපයෝගී කරගෙන කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීම සඳහා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කළ හැකි යන්ත්‍රයක් මිලදී ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සෙනොක් ආයතනය විසින් ඉදිරිපත් කොට ඇති ව්‍යාපෘති වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා ලබා දී ඇති බවත්, එම යන්ත්‍රයේ දිග අඩි 30 ක් බවත්, පළල අඩි 11 ක් බවත්, උස අඩි 10 ක් බවත්, මෙම යන්ත්‍රයට දිරන කසළ ඇතුළත් කොට දින 14 කට පසු කොම්පෝස්ට් පොහොර ලබා ගත හැකි බවත්, දිනකට දිරන කසළ ටොන් පහක් දක්වා මේ සඳහා භාවිතා කළ හැකි මෙම යන්ත්‍රය දැනට වෙළඳපොලේ රුපියල් ලක්ෂ 250 කට පමණ අළෙවි කරන බවත්, එක් මාසයකට රුපියල් ලක්ෂ එක හමාරක පමණ මුදලක් මොන්රෝවියා වත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ගෙවීම් කරන බවත්, මෙම යන්ත්‍රය මිලදී ගැනීමෙන් එම මුදල ඉතිරි වන බවත්, මෙම යන්ත්‍රය භාවිතයෙන් නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර විකිණීමෙන් නව ආදායම් මාර්ගයක් ප්‍රාදේශීය සභාවට උත්පාදනය කොට ගත හැකි බවත්, මෙවැනි යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ඉදිරියේදී මිල ගණන් කැඳවන බවත්, ඉදිරියේදී මොන්රෝවියා වත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වෙත කසළ බැහැර කිරීමේ කටයුතු සිදු කිරීම බලාපොරොත්තු විය නොහැකි බවත්, පර්චස් 50 ක පමණ බිම් කොටසක මෙම යන්ත්‍රය භාවිතයෙන් කාබනික පොහොර නිෂ්පාදනය කළ හැකි බවත්, මේ සමග බොබ්කැට් යන්ත්‍රයක් මිලදී ගත යුතු බවත්, එමගින් ශ්‍රම වියදම අඩු කර ගත හැකි බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා භූමියක් ප්‍රාදේශීය සභාව සතුව තිබේද යනුවෙන් ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

පෝද්දල කන්දේ පර්චස් 70 ක බිම් කොටසක් සභාව සතුව ඇති බවත්, එහි පිවිසුම් මාර්ගය සම්බන්ධව පැවති ගැටළුව මේ වන විට නිරාකරණය කර ඇති බවත්, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පර්චස් 30 ක 40 ක පමණ බිම් කොටසක් සොයා ගැනීමට බාධාවක් නොමැති බවත්, හපුගල ප්‍රදේශයේද සභාව සතුව ඉඩමක් ඇති බැවින්, එම ඉඩම වුවද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කළ හැකි බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**21.** වක්වැල්ල, එළගොරකගහවත්ත, නො.471/07 ලිපිනයේ පදිංචි එච්.ඩබ්. මේබලා මදුශානි මහත්මියට සහ ගගන විදුශාන් වීරසූරිය මහතාට හිමිකම් ඇති ඉඩමේ පෞද්ගලික මාර්ගය සම්බන්ධව ඇති මායිම් ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා සිදුකරන මැනුම් කටයුත්ත සභාවේ අධීක්ෂණය යටතේ සිදු කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම කාර්යය සඳහා සභා අරමුදල් වියදම් නොවන බවත්, අදාළ කාර්යය අධීක්ෂණය කිරීමේ කටයුතු පමණක් ප්‍රාදේශීය සභාවේ මැදිහත් වීමෙන් සිදු කරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම යෝජනාව සම්බන්ධව ඉඩම් ආරවුලක් පවතින බවත්, ඒ සඳහා අදාළ පාර්ශවයන් විසින් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බවත්, එම නිසා මෙම කාර්යය සඳහා සභාවේ මැදිහත්වීම අනවශ්‍ය බවත්, මෙම

මාර්ගය සභාවට පවරා ගෙන නොමැති බවත් මෙම ඉඩම් ආරවුල අධිකරණයට යාම මඟින් නිරාකරණය කළ යුතු බවත් ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම මාර්ගය මැනුම් කටයුතු සිදු කිරීම සභාවේ අධීක්ෂණය යටතේ සිදු කරන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් වී ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම ඉඩම් ආරවුල අධිකරණය හමුවට ගියහොත් සභාවට කරුණු දැක්වීමට සිදු වන බවත්, ඉඩම් ආරවුලක් ඇති මෙම ගැටළුව සඳහා සභාවේ මැදිහත් වීම අනවශ්‍ය බවත්, මෙය සභාවට සම්බන්ධ ගැටළුවක් නොවන බවත්, මේ සඳහා තමා විරුද්ධ බවත්, ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

එම විරෝධතා සතියක් තුළ දැනුම් දෙන ලෙසත් මේ සඳහා සභා අරමුදල් වැය නොවන බවත්, සභාවේ නිලධාරියෙකු මැනුම් කටයුතු අධීක්ෂණය සඳහා සහභාගී වීම සිදු වන බවත් මෙය අධිකරණ තීන්දුවක් මඟින් ලබා දී ඇති මාර්ගයක් නිසා අභියෝගයට ලක් කළ නොහැකි බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**22.** ලබුදූව, තුත්තිරිපිටිය වත්ත මාර්ගය මැන මායිම් නිවැරදි කොට මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

තුත්තිරිපිටිය වත්ත මාර්ගයේ අතුරු මාර්ගයක් වන මෙම මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කොට ඇති බවත්, මෙම ඉල්ලීම කරන ලද පුද්ගලයා විසින් තම ඉඩම මැනීමේදී මාර්ගයේ මායිම වෙනස් වී ඇති බවත්, මේ සඳහා මාර්ගයේ මැනුම් කටයුතු සිදු කොට නැවත සංවර්ධනය කිරීමට සිදු වන බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම මැනුම් කටයුතු සමගියෙන් සිදු කොට ඇති බැවින්, මෙම මාර්ගය සංවර්ධනය කර දෙන ලෙස ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

මෙම මාර්ගය දැනට හොඳ මට්ටමක නොමැති බවත්, 2006 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් සංවර්ධනය කොට ඇති බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**23.** අප බල ප්‍රදේශය කේන්ද්‍ර කරගෙන පවත්වන ලබන ගෙවතු වගා තරගයේ ජයග්‍රාහකයන් වෙත කිලෝ 25 කාබනික පොහොර මළු 50ක් ත්‍යාග ලෙස ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මතුගම ගුණරතන නායක ස්වාමීන් වහන්සේ විසින් මෙම තරගය සංවිධානය කරන බවත්, එම ස්වාමීන් වහන්සේ විසින් කාබනික පොහොර මලු 50 ක් ත්‍යාග ලෙස ලබා දෙන මෙන් ඉල්ලීමක් කළ බවත්, තමාගේ පුද්ගලික වියදමින් තාච්චි 50 ක් ද මේ සඳහා ලබා දෙන බවත්, රමේෂ් පතිරණ ගරු ඇමතිතුමා විසින් උදලු තල 50 ක් ලබා දීමට එකඟතාවය පළ කොට ඇති බවටත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමාගේ යෝජනා**

පසුගිය දිනක පාකිස්ථානයේදී අමානුෂික ලෙස ඝාතනය කරන ලද ප්‍රියන්ත කුමාර මහතා වෙනුවෙන් ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සිය සාතිශය සංවේගය පල කරන ලදී.

ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් 24 වන යෝජනාව ඉල්ලා අස් කර ගන්නා ලදී.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**25.** කපුහෙම්පල කටුගහහේන ප්‍රදේශයට සහ කපුහෙම්පල දොස්තරදූව ප්‍රදේශයට විදුලිය ලබා දී ඇත්තේ වෙල්යාය මධ්‍යයෙන්ය. නිතර ගිරවුන්, වඳුරන් වැනි සතුන් අනතුරට ලක්වන අතර විදුලිය විසන්ධි වූ විට නැවත යථා තත්ත්වයට පත්කිරීමට නිලධාරීන් දැඩි අසීරුවකට ලක්වෙයි. එම ප්‍රදේශවලට පිවිසෙන මාර්ග ඔස්සේ නිවෙස් ආසන්නයටම විදුලි රැහැන් ඇද ඇත. එයට සම්බන්ධකර පද්ධතිය ක්‍රමවත් ලෙස සවිකර දෙන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**26.** ප්‍රදේශීය සභාව මගින් කපුහෙම්පල ප්‍රදේශයට එවන ලද කැලි කසළ එකතු කිරීමේ වාහන පහත දක්වා ඇති ප්‍රදේශයන් සඳහාද යැවීමට යෝජනා කරමි.

- තොටගොඩ, බැදිපාර, මල්මාවත, පත්තිනිදූව දක්වාද
- කපුහෙම්පල ගොඩදූව මාර්ගයේ මධ්‍යම පාලම දක්වාද
- කපුහෙම්පල සේනානායක මාවත, පිංදූව හන්දිය දක්වාද

ඉහත යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ මාර්ගයන්හි කසළ වාහන ගමන් කිරීමට ඇති හැකියාව සොයා බලා මේ සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම මාර්ග කාපට් යොදා සංවර්ධනය කොට ඇති මාර්ගයන් බැවින්, කසළ වාහන ගමන් කිරීම සඳහා බාධාවක් නොමැති බවට ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**27.** සභාව මගින් අනුමත කිරීමට අවම බිම් ප්‍රමාණය වනුයේ පර්චස් 06½ ක්ය. ඉඩම් මිල අධික වීම නිසා එය ජනතාව දැඩි අසීරුතාවයකට පත් කරන කරුණකි. එය පර්චස් 05ක් දක්වා අඩු කිරීමට සභාවේ අවධානයට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අනුමත කිරීම සඳහා අවම පර්චස් ප්‍රමාණය පර්චස් 06 ක් බවත්, කොම්පෝස්ට් බඳුන් තැබීම, වැහි ජල ටැංකි ඉදිකිරීම වැනි කොන්දේසි ඇති නිසා අනුමත කරන බිම් ප්‍රමාණය කුඩා වුවහොත් නාගරික සංවර්ධන අධිකාරියේ කොන්දේසි අනුව මෙය සිදු කළ නොහැකි බවත්, කොන්දේසි සම්පූර්ණ කළ නොහැකි බවත්, මාර්ගයේ ආසන්නයේ සිට නිශ්චිත දුරකින් නිවාස ඉදිකළ යුතු බව සහ නිවසේ පිටුපස සිට නිශ්චිත දුර ප්‍රමාණයක් තැබිය යුතු බැවින් මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමේදී ගැටළු පවතින බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

තොටගොඩ, කපුහෙම්පල වැනි ප්‍රදේශ කරාපිටියට ආසන්නව පිහිටි නිසා ඉඩම් මිල ඉතා ඉහළ බවත්, ඒ සඳහා පිළියමක් ලෙස මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්, නාගරික බල ප්‍රදේශවල පර්චස් 05 ඉඩම්වල වුවද, නිවාස ඉදිකිරීම සඳහා අනුමත කරන ලද බවත් ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

නාගරික බලප්‍රදේශ වලද, නේවාසික භාවිතය සඳහා අනුමත කරන අවම බිම් ප්‍රමාණය පර්චස් 06 ක් බවත්, අධිකරණ තීන්දුවකින් බෙදා වෙන් වෙන ඉඩම් සඳහා පමණක් යම් සහනයක් ලබා දෙන බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**28.** තොටගොඩ සුගුණ මාවතේ, දෙවන පටුමගේ අවසන් කොටස කොන්ක්‍රීට් යොදා සංවර්ධනයට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**29.** පැරමවුන්ට් පාර්ක් අවසන් කොටසේ අතුරු මාර්ගය (විද්‍යාරත්න මහතාගේ නිවස අසළ) කොන්ක්‍රීට් යොදා සංවර්ධනයට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**30.** තොටගොඩ, අඹගහවත්ත, මාර්ගයට අවහිර වී ඇති විදුලි කණුව මාර්ගයට අවහිර නොවන පරිදි සිටුවන ලෙස ලංකා විදුලිබල මණ්ඩලය වෙත දැනුවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**31.** තොටගොඩ, අඹගහවත්ත, මල්මාවතේ අවසානයේ ඇති තුංමන්හන්දිය අසළට හියුම් පයිප්ප යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පාර හරහා ජලය ගමන් කිරීම හේතුවෙන් ගැටළු පැන නැගී ඇති බැවින්, මෙම මාර්ගය සඳහා කඩිනමින් සිලින්ඩර් යොදා සංවර්ධනය කර දෙන ලෙස ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමාගේ යෝජනා</u>**

**32.** මීපාවල ශ්‍රී සුදර්ශනාරාම පිවිසුම් මාර්ගය විහාරස්ථානයේ වැඩ වෙසෙන ආගමික වශයෙන් දක්ෂිණ ලංකාවටම මහත් සේවාවක් සිදුකරමින් දැනට විහාරස්ථාන තුනක විහාරධිපතිධූරය දරණ මිල්ලව සමිද්ධි නායක හිමි මාවත නමින් නම් කරන මෙන් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**33.** මීපාවල, කලංසූරිය මාවතේ අතුරු මාර්ගයේ කැඩී ඇති පැති බැම්ම අනතුරුදායක බැවින් ඉක්මණින් එය අළුත්වැඩියා කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම මාර්ගයේ එක් කොටසක් මේ වන විට කඩා ගෙන ගොස් ඇති බැවින්, පැති බැම්ම ඉදිකිරීමේ කටයුතු සඳහා අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**34.** පෝද්දල, කුඩාවෙල්ල මාර්ගයෙන් හැරී එන හවුපිගේවත්ත මාර්ගයේ ආරම්භයේ සිට මීටර් 100ක් පමණ කාණුව අවහිර වී ඇති බැවින් සභාවේ බැකෝ යන්ත්‍රය යොදා කාණුව කැපීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ ස්ථානය ගරු සභාපතිතුමාගේ නියමය පරිදි තාක්ෂණ නිලධාරිතුමිය විසින් නිරීක්ෂණය කළ බවත්, එම කාණුව සුද්ධ කිරීම සඳහා ජේ.සී.බී. යන්ත්‍රය කඩිනමින් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>**

**35.** ආචාර්ය රිචඩ් පතිරණ ප්‍රාථමික විද්‍යාලයේ ජලය බැස යන කාණු පද්ධතිය අවහිර වීම නිසා පාසල් දරුවන් මෙන්ම නිවැසියන්ද දැඩි අපහසුතාවයට පත්ව ඇත. ජලය බැස යා හැකි ආකාරයට කාණු පද්ධතිය සැකසීමටත්, දරුවන්ට ගමන් කළ හැකි ආකාරයට මඩ පිහිටි භූමිය සකසා ගැනීමට සභාව තුළ ගොඩ ගසා ඇති කොන්ක්‍රීට් කුට්ටි ගල් ලබා දීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම ස්ථානය පහත් බිමක් හේතුවෙන් ජලය රඳා පවතින බවත්, අඩි 04 ක පමණ පළලට කැට ගල් ඇල්ලීමට අවශ්‍ය බැවින් මෙම කැටගල් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

කැට ගල් ලබා දීම පාසලට කරන උදව්වක් ලෙස සිදු කළ හැකි නමුත් පාසල්වල සංවර්ධන කටයුතු සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් හරහා මුදල් වෙන් වන බවත්, විදුහල්පතිතුමා විසින්ද මේ සම්බන්ධව ඉල්ලීම් කොට ඇති බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**36.** කරාපිටිය, කිරිමැටියමුල්ල, දෙණියවත්ත මාර්ගයට අවහිර අයුරින් ඇති විදුලි කණුව සහ දුරකථන කණුව නිසා එම මාර්ගය භාවිතා කරන නිවාස 12ක ජනතාව දැඩි අපහසුතාවයට පත් වන බැවින් මෙම විදුලි කණුව සහ දුරකථන කණුව ඉවත් කර දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අඩි 07 ක පළල ඇති පාරක් වන මෙහි මාර්ගයට අවහිර ලෙස විදුලි කණුවක් සහ දුරකථන කණුවක් සවි කර ඇති බවත්, මේ සම්බන්ධව අදාළ ආයතනය කිහිපවරක්ම දැනුවත් කොට ඇති බවටත් ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සභාවේ එකඟතාවයකින් තොරව කණු සිටුවීමෙන් වළකින ලෙස  අදාළ ආයතන වෙත දැනුම් දී ඇති බවත්, මෙම කණුවලට මාර්ගයේ ගමන් කරන වාහනවලින් අනතුරක් සිදුවුවහොත් වන්දි මුදල් ගෙවීමට සිදු වන බවත්, මෙම ගැටළු සම්බන්ධයෙන් ඉදිරියේදී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී අදහස් දැක්වීමට බලාපොරොත්තු වන බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**37.** කරාපිටිය, කිරිමැටිමුල්ල, දෙණියවත්ත මාර්ගයේ ආරම්භක කොටස සභාවට අත්පත් කර ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**38.** ගොඩකන්ද, සිරිපාල ලියනගේ මාවතේ ජල ගැටලුව විසඳීම සඳහා කාණු පද්ධතියක් ඉදිකිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**39.** ඉලේපෙරුම මාවතේ අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**40.** සභාවේ නීතිමය කටයුතු සඳහා නීතිඥ මහතෙකු බඳවා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා නීතිඥ තනතුරක් කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගත යුතු බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

සභා අරමුදලින් නඩු කටයුතුවලට විශාල වියදමක් දරණ බැවින්, සභාවේ නඩු කටයුතු සඳහා සුදුසු නීතිඥවරයෙකුට භාර දෙන ලෙස ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එක් එක් නඩු වර්ගවලට වෙන් වෙන් වූ නීතිඥවරු සිටින බවත්, ඔවුන් විසින් අදාළ විෂයයන් බෙදා ගෙන කටයුතු කරන බවත්, නඩුවේ ස්වභාවය අනුව නීතිඥවරුන්ට නඩු භාර දෙන විට ඔවුන්ගේ වෘත්තීය නිපුණතාවය පිළිබඳව සළකා බැලිය යුතු බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

අඩුපාඩුකම් නිසා නීතිය ක්‍රියාත්මක කළ යුතු කාර්යයන් අඩාල වී ඇති බවත්, මෙම ගැටළු නිසා ගරු සභිකවරු අපහසුතාවයට ලක්ව ඇති බවත්, ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**41.** පහත සඳහන් අනවසර ඉදිකිරීම් සහ අවහිර කිරීම් නිසා පත්ව ඇති ගැටළු විසඳීම සඳහා කඩිනමින් නඩු පවරා නීතිය ක්‍රියාත්මක කිරීමටත්, එම වියදම් අදාළ විත්තිකරුවන්ගෙන් අයකර ගැනීමටත් යෝජනා කරමි.

- උළුවිටිකේ ලිද්දෙණියවත්ත අතුරු මාර්ගය අවහිර කරමින් ඉදිකර ඇති තාප්පය
- ගැමුණු මාවතේ ජලය බැසයන කාණුව අවහිර කරමින් ඉදිකර ඇති ගරාජය
- බංගලාවත්ත, විශාකා මහත්මියගේ නිවසට අනතුරුදායක ලෙස ඉදිකර ඇති බැම්ම
- ගල්කැටියවත්ත, ඇළ මාර්ගය අවහිර කරමින් ඉදිකර ඇති නිවස සහ අනවසර ගොඩකිරීම
- කරාපිටිය, සන්සයිඩ් ගාර්ඩන්ස් ඉඩමේ මාර්ගය අවහිර කිරීම

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම කරුණු පහ සඳහා ලබන මහා සභා රැස්වීමට පෙර ක්‍රියාමාර්ග ගන්නා ලෙස ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**42.** ගොඩකන්ද, කෝපිවත්ත ක්‍රිස්ටල් සිටි ඉඩම, හිරිඹුරගම තරංගා ලෑන්ඩ් ඉඩම ජල සැපයුම නොමැතිවීම නිසා පදිංචිකරුවන් දැඩි අපහසුතාවයකට පත්ව ඇත. කඩිනමින් ජල සැපයුම ලබා දෙන ලෙස වෙන්දේසිකරුවන්ට දන්වා නීතිමය පියවර ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ජල ගැටළුව තවමත් ඇති බවත්, ජලය නොමැතිකම නිසා එම වෙන්දේසි ඉඩම්වල පදිංචිකරුවන් අපහසුතාවයට පත්ව ඇති බවත්, එම වෙන්දේසි ඉඩමේ නළ ළිඳක් හෝ නොමැති බවත්, ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධව අදාළ ඉඩම් වෙන්දේසි කරන ලද ආයතන වෙත දන්වා යවා ඇති බවත්, මෙම ගැටළු නිරාකරණය කරන තෙක් එම ඉඩම් වෙන්දේසි ආයතන විසින් සිදු කරනු ලබන අනෙකුත් වෙන්දේසි ඉඩම්

සඳහා අනුමැතිය ලබා නොදෙන බවත්, මෙම ගැටළු සම්බන්ධව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්නා බවටත් දන්වා යවා ඇති බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**43.** හිරිඹුරගම, අමර මාවත සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**44.** ආපදා අවස්ථාවකදී, අනවසර ඉදිකිරීම්, අනතුරුදායක ගස්, සම්බන්ධ මහජන මුදල් ගෙවීම් කිරීමේදී නීතිය මගහැර සිටි අයවලුන්ට එම වන්දි මුදල් ගෙවීමට අවශ්‍ය නීති ප්‍රතිපාදන සකසා ක්‍රියාත්මක කරන ලෙසට අතිගරු ජනාධිපතිතුමාගෙන්, ගරු අගමැතිතුමාගෙන්, ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන්, ආපදා කළමනාකරණ අමාත්‍යංශයේ ලේකම්තුමාගෙන්, ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලා යැවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එක් ස්ථානයක අනවසර පැති බැම්මක් කඩා වැටීමෙන් සිදු වූ හානිය සඳහා රුපියල් ලක්ෂ 22 ක ඇස්තමේන්තුවක් සකස් කොට ඇති බවත්, මේවා සඳහා ගෙවීම් කරන්නේ රජයේ මුදල් වලින් බවත්, ජස්ටින් කන්දේ රුක්අත්තන ගසේ අතු කඩා වැටීම නිසා සිදු වූ හානියට රුපියල් ලක්ෂ හතරහමාරක වන්දි ලබා දී ඇති බවත්, අනවසර ඉදිකිරීම් නිසා සිදු වන අනතුරු සඳහා ආපදා කළනාකරණ මධ්‍යස්ථානය හරහා මෙම වන්දි මුදල් ගෙවන බවත් ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**45.** ගොඩකන්ද මාර්ගයට අනතුරුදායක අඹ ගස සහ හිරිඹුර ගැමුණු මාවතට අනතුරුදායක අඹ ගස සහා අරමුදලින් කපා ඉවත් කිරීමට ගස් කැපුම්කරුවන් ඉදිරිපත් නොවන නිසා එම අඹ ගස් දෙක දර ලබා ගැනීම සඳහා කපාගෙන යාමට කැමති පුද්ගලයෙකු හට කපා ගැනීමට අවසර දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**සංශෝධන :-** ගොඩකන්ද මාර්ගයට අනතුරුදායක අඹ ගස සහ හිරිඹුර ගැමුණු මාවතට අනතුරුදායක අඹ ගස කපා ඉවත් කිරීමට ගැණුම්කරුවන් ඉදිරිපත් නොවන නිසා එම අඹ ගස් දෙක දර ලබා ගැනීම සඳහා කපාගෙන යාමට කැමති පුද්ගලයෙකු හට කපා ගැනීමට අවසර දීමට යෝජනා කරමි.

ඉහත සංශෝධනය ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම අඹ ගස් දෙක වෙන්දේසි කිරීමට ඉදිරිපත් කළද, ගැනුම්කරුවන් ඉදිරිපත් වුයේ නැති බවත්, එම නිසා මෙම අඹ ගස කපා ගෙන යාමට කැමති අයෙකුට අනුමැතිය ලබා දෙන ලෙස ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**46.** ගොඩකන්ද, පන්සල වත්ත මාර්ගයට හා විදුලි රැහැන්වලට අවහිර ගස් සහා අරමුදලින් කපා ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව විදුලිබල මණ්ඩලයේ නිර්දේශ ලබා ගත යුතු බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(තේ පානය සඳහා සභාව කල් තබන ලදී.)**

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා**

**47.** වැලිපිටිමෝදර, ගංගාතිලක පන්සල අසළ සිට දිල්හානි මහත්මියගේ නිවස අසළින් ඇති කාණු පද්ධතිය එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදා සුද්ධ පවිත්‍ර කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව මීට පෙර යෝජනා කර ඇති බවත්, මෙම යෝජනාව වෙනත් ආයතන හරහා ඉටු කර ගැනීමට තමා විසින් උත්සාහ කළ බවත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් මෙම කාණුව ප්‍රාදේශීය සභාවට අයිති බවට තමාව දැනුවත් කළ බවත්, එම ප්‍රදේශයේ ජනතාවට මෙම කාරණය ඉෂ්ඨ කර ගැනීමට ලොකු අවශ්‍යතාවයක් ඇති බවත්, පියදිගම ග්‍රාම නිලධාරි වසමේ සන්බීම් පාර්ක් අසළ සිට ඇති අද්දර ඇළ මාර්ගය වාරිමාර්ග දෙපාර්තමේන්තුව හරහා කැපූ ඇළ දක්වා තම මැදිහත් වීමෙන් සුද්ධ පවිත්‍ර කරන බවත් ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**48.** වැලිපිටිමෝදර, ථූපාරාම පන්සල අසළ සිට සිට නසීම් මහතාගේ නිවස අසලින් ඇති කාණු පද්ධතිය සෝමාරාම පන්සල අසළ දක්වා එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදා සුද්ධ පවිත්‍ර කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම කාරණය අත්‍යාවශ්‍යයෙන්ම ඉටු කළ යුතු බවත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් මෙම යෝජනාවට අදාළ කාණුව සුද්ධ පවිත්‍ර කිරීමට නොහැකි බවට තමාව දැනුවත් කළ බව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**49.** දඩල්ල, වාලුකාරාම පන්සල අසළ සිට දුම්රිය මාර්ගයට මායිම්ව ඇති පාරේ ජලය බැසයන පරිදි සිලින්ඩර් දෙකක් යොදා රසිකා මහත්මියගේ සහ අනෙකුත් නිවාසවලට යන පාර පිළිසකර කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ස්ථානය හරහා උඩහ සිට එන වතුර පාර ගලා බසින බැවින් සිලින්ඩර් යොදා මාර්ගය සකස් කර දීමට තමා විසින් යෝජනා කළ බවට ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාගේ යෝජනා**

**50.** මාම්පිටිය වසමේ, පල්ලේගෙවත්ත, පළමු පටුමගේ ඇති පාලම අබලන් වී ඇති බැවින්, දෙපස ඉවුරු බැඳ, පාලම දෙපස ආරක්ෂිත වැටක් සවිකොට සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම පාලම මාම්පිටිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටා ඇති මෙම පාලම අබලන් වී ඇති බැවින්, මෙය ඉතා ඉක්මනින් ඉටු කළ යුතු කාරණාවක් බව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**51.** කලේගාන කොට්ඨාශයට අයත්, වටරැක නැගෙනහිර, රජගෙදර වත්ත ප්‍රදේශයේ සිට කලුපහන ප්‍රදේශය දක්වා වරිපනම් අයකිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම ප්‍රදේශවාසීන් විසින් කසළ ට්‍රැක්ටරය තම ප්‍රදේශයටද එවන ලෙස සභාවට පැමිණ ඉල්ලීම් කළ පසු වරිපනම් නොගෙවන ප්‍රදේශයක් බැවින්, එය ඉටු කළ නොහැකි බවට දැනුම් දී ඇති බැවින්, අදාළ ප්‍රදේශවාසීන් විසින් වරිපනම් බදු ගෙවීමට එකඟතාවය පළ කළ බවට ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**52.** 2022 වර්ෂයේදී කැලි කසළ එකතු නොකරන මාර්ගයන්වල කැලි කසළ එකතු කිරීමට වැඩපිළිවෙලක් සැකසීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මිහිඳු මාවතේ ජනතාව මේ පිළිබඳව තමාගෙන් දිගින් දිගටම ඉල්ලීම් කරන බවත්, එම නිසා මේ සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීමට යෝජනා කළ බව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**53.** 2022 වර්ෂය සඳහා කලේගාන කොට්ඨාශයේ අඩු ආදායම්ලාභි පවුල්වල දරු දැරියන් සඳහා රු.25,000.00 ක අභ්‍යාස පොත් පරිත්‍යාග කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**54.** පහත දක්වා ඇති ස්ථාන සඳහා පදික මාරු (කහ ඉරි) සකස්කරන ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීමට යෝජනා කරමි.

- කලේගාන - ගිංතොට මාර්ගයේ කලේගාන සතොස ඉදිරිපිට
- ගාල්ල - වක්වැල්ල මාර්ගයේ ඉසුරු මාවත අරම්භක ස්ථානයට
- ගාල්ල - වක්වැල්ල මාර්ගයේ සෙන්ට්රීටාස් මාවත ආරම්භක ස්ථානයට

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**55.** ටයිනි පාරේ පාලම අලුත්වැඩියා කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම ඇළෙහි අයිතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතු බැවින්, මේ පිළිබඳව අදාළ ආයතනය කඩිනමින් දැනුවත් කරන ලෙස ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**56.** ඉසුරු මාවතේ හතරවන පටුමග සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**57.** වී.සී පාරේ ජයසිරි මහතගේ නිවස අසළ ඇති ඇළ මාර්ගය කුලී පදනම මත ලබා ගත් එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදා ගනිමින් සුද්ධ පවිත්‍ර කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉල්ලීම් ඉදිරිපත් කළද, මෙතෙක් එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදාගෙන කලේගාන කොට්ඨාශයේ සංවර්ධන කටයුතු සිදු නොකළ බවත්, ඉදිරි වර්ෂයේදී තම කොට්ඨාශයේ සංවර්ධන කටයුතු සඳහා කුලී පදනම මත ලබා ගත් එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදවන ලෙස ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**58.** වටරැක චන්දරේ බේකරිය ඉදිරිපිට කාණුව සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදා ගෙන සුද්ධ පවිත්‍ර කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ගැටළුව ගරු සභාපතිතුමා විසින්ද නිරීක්ෂණය කළ බවත්, වර්ෂාව සහිත අවස්ථාවන් වලදී එම ස්ථානයෙන් ගමන් කිරීමේ අපහසුතා ඇති බවද ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**59.** ජයබිම හාඩ්වෙයාර් එක අසළ ඇති ඇළ මාර්ගය කුලී පදනම මත ලබා ගත් එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදා ගනිමින් සුද්ධ පවිත්‍ර කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**60.** කොඩිතුවක්කු ගාර්ඩන්ස් වෙන්දේසි ඉඩම අසළ කාණුව සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදා ගෙන සුද්ධ පවිත්‍ර කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා</u>**

**61.** නරාවල මාටින් පෙරේරා මාවත කාපට් යොදා සංවර්ධනය කර ඇති නමුත් අඩුපාඩු රාශියක් ඇති බැවින් ඒ සඳහා තාක්ෂණ නිලධාරි වාර්තාවක් ලබා ගෙන එම අඩුපාඩු නිවැරදි කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට දන්වා යැවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මාටින් පෙරේරා මාවත සංවර්ධනය කිරීම පිළිබඳව මින් පෙර පැවති මහා සභා රැස්වීම් වලදීද තමා විසින් අදහස් දක්වා ඇති බවත්, මේ වන විටත් එම මාර්ගයේ අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට නොහැකි වූ බවත්, බර වාහන ගමන් කිරීම නිසා මෙම මාර්ගයේ අතුරු මාර්ගයන්ද අබලන් වී ඇති බවත්, ස්ථාන දෙකකින් මාර්ගය පළුදු කොට ජල සැපයුම ලබා දී ඇති බවත්, මෙම මාර්ගය සංවර්ධනය කිරීමට පෙර ජල සැපයුම අවශ්‍ය අයට බට යොදා ගන්නා ලෙස තමා විසින් දැනුවත් කළ බවත්, කාපට් යොදා සංවර්ධනය කරන ලද මාර්ගයන් පළුදු කිරීම සඳහා අවස්ථාව ලබා නොදෙන ලෙසත් ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

තාක්ෂණ නිලධාරිණිය සමඟ ගොස් එම මාර්ගයේ අඩුපාඩු සම්බන්ධව වාර්තාවක් ලබා ගන්නා බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා**</u>

**62.** කිතුලම්පිටිය, පැණියදෙණිය, පැල්ගොල්ලගෙවත්ත මාර්ගය එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදවා ගමන් කිරීමට පහසු පරිදි සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම මාර්ගය කඳු සහිත මාර්ගයක් වන අතර පාගමනින් වුවද ගමන් කිරීමට අපහසුතා ඇති බවද, ජේ.සී.බී. යන්ත්‍රයේ පළල වැඩි නිසා මේ සඳහා එක්ස්කැවේටර් යන්ත්‍රයක් යෙදවිය යුතු බවද ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ සඳහා තාක්ෂණ නිලධාරි නිර්දේශ ලබා ගෙන අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**63.** පැණියදෙණිය, රේණුකා මහත්මියගේ නිවස අසළ සිට මීටර් 200ක් ඉදිරිපිටට ඇති ඇළ මාර්ගය එක්ස්කැවේටර් යන්ත්‍රයක් මගින් පුළුල් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**64.** ආනන්ද මාවතේ සිට එගොඩහවත්ත දක්වා ඇති ඇළ මාර්ගය එක්ස්කැවේටර් යන්ත්‍රයක් මගින් පුළුල් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**65.** හොරගස්කැළය මාර්ගය අසළ සිට ඇති ඇළ මාර්ගය මීටර් 200ක් ඉදිරියට පුළුල් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම ඇළ මාර්ගය මේ වන විට අවහිර වී ඇති බවත්, එහි පළලද ප්‍රමාණවත් නොමැති බවත්, ඇළෙහි පළල අඩි පහක පමණ ප්‍රමාණයක් ඇළ දෙපස මායිම් කණු සිටුවා ඇති බවත්, දැනට ඇළෙහි ජලය බසින ප්‍රමාණය ඇත්තේ අඩි 02 ක් පමණ වන එම ඇළ මාර්ගය තව අඩි දෙකක් පමණ පළල් කර ගත යුතු බවට ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

බලප්‍රදේශය තුළ සිදු කරනු ලබන සංවර්ධන කටයුතු සඳහා එක්ස්කැවේටර් යන්ත්‍රයක් අප ප්‍රාදේශීය සභාව වෙත මිල්දී ගැනීම වඩා ලාභදායක බව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

දැනට වසර තුනකට පමණ පෙර තමා විසින් එක්ස්කැවේටර් යන්ත්‍රයක් මිල්දී ගන්නා ලෙස සභාවට යෝජනා කළ නමුත්, ඒ කාර්යය අද වෙනතුරු ඉටු කර ගැනීමට නොහැකි වූ බවත්, එක්ස්කැවේටර් යන්ත්‍රයක් මිල්දී ගන්නා විට එය ප්‍රවාහනය කිරීම සඳහා ටිපර් යන්ත්‍රයක්ද මිල්දී ගත යුතු බවත්, මේ සඳහා රුපියල් ලක්ෂ දෙසීයකට අධික වියදමක් දැරීමට සිදු වන බවත්, සභාව සතුව එක්ස්කැවේටර් යන්ත්‍රයක් නොමැති වුවද, බලප්‍රදේශයේ ජනතාව ගංවතුර වැනි ආපදා තත්ත්ව වලින් වැළැක්වීම සඳහා අවහිර වී ඇති ඇළ මාර්ග හා කාණු පද්ධති සුද්ධ පවිත්‍ර කළ යුතු බවට, ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා විසින් අදහස් දක්වන ලදී.

කුලී පදනම මත එක්ස්කැවේටර් යන්ත්‍රයක් යෙදවීම පාලනයකින් යුතුව සිදු කළ යුතු බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**66.** පලාගලකන්ද, ඉහළ මාර්ගයේ කාණු පද්ධතිය එක්ස්කැවේටර් යන්ත්‍රයක් මගින් සකස්කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම කාණුවද සම්පූර්ණයෙන් වාගේ අවහිර වී ඇති බැවින්, නිවාස හතක පමණ ජනතාව පීඩාවට පත්ව ඇති බවට ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**67.** කහදූවවත්ත, ඇළ මාර්ගය එක්ස්කැවේටර් යන්ත්‍රයක් මගින් පුළුල් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ඇළ මාර්ගයද අවහිර වී ඇති බැවින් ජනතාව පීඩාවට පත්ව ඇති බවත්, හැකි ඉක්මනින් මෙම කාර්යය ඉටු කර දෙන ලෙස ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභාවල වාර්තා ඃ-**

**01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව ඃ-**

**I.** 2021-12-03 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව ඃ-**

**I.** 2021-12-03 දින පැවති තාක්ෂණික සේවා කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව ඃ- නැත**

**04. පරිසරය සහ පහසුකම් කමිටුව ඃ- නැත**

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2021 වර්ෂයේ නොවැම්බර් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2021 වර්ෂයේ නොවැම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව</u>**

2021 වර්ෂයේ නොවැම්බර් මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>04. වෙනත් ලේඛන</u> ඃ-**

I. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් 2021 වර්ෂයට අදාළ මෙහෙයුම් හා කාර්ය සාධන විගණන වාර්ථාව සභා ගත කරන ලදී.

II. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් 2022 වර්ෂයට අදාළ සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ලේඛනය සභා ගත කරන ලදී.

**<u>(ඌ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා</u>**

**<u>පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය</u>**

**<u>2021 වර්ෂයේ දෙසැම්බර් මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.</u>**

තොටගොඩ කඩවත වත්ත නව නිවාස සංකීර්ණයේ ජලය ක්‍රමවත් ලෙස බැස නොයාම පිළිබඳව ගැටළු පවතින බවත්, පැය දෙකක පමණ වර්ෂාවකට පසු එම කාණු පද්ධතිය සම්පූර්ණයෙන්ම උතුරා යන බැවින් දැනට පදිංචිව සිටින නිවාස වල අප ජලය බැහැර කිරීම සඳහා කාණු පද්ධතියක් නොමැති බැවින්, එම අපද්‍රව්‍ය බැදි පාරට ගලා එන බැවින්, ඒ සඳහා ඉක්මනින් විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලද ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් තොටගොඩ අත්ථදස්සි විද්‍යාලය අසල පාලම් දෙකක් ඉදිකරන බවත්, මේ නිසා පෙර පැවති එක් පාලමක් සම්පූර්ණයෙන්ම වසා දමා ඉදිකිරීම් කටයුතු සිදු කරන බවත්, දැනට මාස හතරක පමණ කාලයක සිට එහි ඉදිකිරීම් කටයුතු නැවතී ඇති බවත්, වර්ෂා දිනවලදී ඒ ආසන්නයේ ඇති අක්කර 60 ක පමණ කුඹුරු යාය මේ නිසා ජලයෙන් යටවන බැවින්, මෙම පාලම් දෙකෙහි වැඩ කටයුතු කඩිනම් කරන ලෙස අදාළ ආයතන වෙත දැනුම් දෙන ලෙස ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

<u>(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)</u>

කොන්ත්‍රාත්කරු විසින් මාර්ගය සංවර්ධනය කිරීම පැහැර හැරීම පිළිබඳව වටරැක නැගෙනහිර ලියනගෙදර වත්ත ගම්වාසීන් විසින් තමා වෙත ඉදිරිපත් කරන ලද ලිපිය ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාගත කරන ලදී.

<u>(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සහ ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)</u>

ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණියගේ ස්වාමිපුරුෂයා රිය අනතුරකට භාජනය වී රෝහල් ගත කර සිටින බැවින්, ඒ සඳහා සංවේගය ප්‍රකාශ කරන ලද ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ඔහු සඳහා ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා, ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා, ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය,ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය වෙත අද දිනයේදී මහා සභා රැස්වීමට සහභාගි වීමට නොහැකි බැවින්, ඔවුන් වෙත නිවාඩු අනුමත කිරීමට ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

වැලිකැටියවත්ත මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම පිළිබඳව ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

වැලිකැටියවත්ත මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීමේ කටයුතු ඉදිරියේදී ආරම්භ කරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ලබුදූව සණස ඉදිරිපිට මාර්ගයේ වැසි ජලය නොබැසීම සම්බන්ධව එම සණස බැංකුව විසින් තමා වෙත ඉදිරිපත් කරන ලද ලිපිය ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් සභාගත කරන ලදී.

පොදු ආයතනයක් වන මෙම සණස සමිතිය හොඳින් ක්‍රියාත්මක වන බවත්, මෙම ගැටළුව සඳහා සාධාරණයක් ඉටු කරන ලෙස ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

ලබුදූව, සිරිධම්ම පාරේ සවිය යෝගට් නිෂ්පාදන ආයතනය ඉදිරිපිට ජලයෙන් යටවීම සිදු වන බවත්, එම ඉඩමේ හිමිකාරීත්වය ඇත්තේ අදාළ සණස සමිතියට සහ මෙම වෙළඳ ආයතනයේ හිමිකරුට වන බවත්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් මෙම ඉඩම් දෙක අතරින් කාණුවක් කැපීමට නිර්දේශ කොට ඇති බවත්, මෙම ඉඩම් දෙකම ගොඩකරන ලද පහත් බිම් වන බවත්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මෙම ගැටළුව සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට සූදානමින් පසුවන බවත්, මෙම කාණුව අප ප්‍රාදේශීය සභාවේ මැදිහත්වීමෙන් කපා දෙන ලෙස ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ඉල්ලීම් කොට ඇති බවත්, ඒ ආසන්නයේ බෝක්කුවක් පිහිටා ඇති නමුත්, ඒ හරහා ජලය ගලා නොබසින බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම ගැටළුව විසඳීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

හෝඑවාගොඩ සංවර්ධන ව්‍යාපෘතියට අදාළ ව්‍යාපෘති වාර්තාව සහ ඇස්තමේන්තුව සභාගත කරන ලෙස යෝජනාවක් ඉදිරිපත් කළ බවත්, ඒ සඳහා අදාළ ආයතන වෙත යොමු කළ බවට පිටපතක් ලැබුණ නමුත්, මාස 9 ක පමණ කාලයක් ගත වී තිබුණද, අදාළ ලේඛන තවම සභාගත කිරීමට නොහැකි වූ බවත් ප්‍රකාශ කරන ලද ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් බලප්‍රදේශය තුළ සිදු කරනු ලබන සංවර්ධන ක්‍රියා පිළිබඳව ගරු සභිකවරුන්ට දැන ගැනීමට අයිතියක් ඇති බැවින්, ඒ සඳහා නැවත සිහිකැඳවීමක් යොමු කොට තිබේද යනුවෙන් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

මේ සම්බන්ධව අදාළ ආයතන දැනුවත් කොට ඇති බවත්, මෙය නාගරික සංවර්ධන අධිකාරිය හරහා සිදු කරන සෘජු ව්‍යාපෘතියක් බවත්, තොරතුරු දැන ගැනීමේ පනත යටතේ අවශ්‍ය අයෙකුට මෙම ව්‍යාපෘතිය සම්බන්ධ තොරතුරු ලබා ගත හැකි බවත්, අදාළ ආයතනය විසින් ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදු කිරීමෙන් අනතුරුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන බැවින් ඒ සඳහා සභාවක් ලෙස බලපෑම් කළ නොහැකි බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

(සභාව පැහැදිලි නොවීය.)

මීපාවල ප්‍රාදේශීය සභා උප කාර්යාලයේ ගොඩ ගසා ඇති කාබනික පොහොර මළු වලින් දුර්ගන්ධයක් හමන බවට අවට ප්‍රදේශවාසීන්ගෙන් තමා වෙත දැන ගැනීමට ලැබුණු පසු එය නිරීක්ෂණය කළ බවත්, අදාළ කාබනික පොහොර නිසි ප්‍රමිතියෙන් සකස් කර නොතිබීම නිසා හෝ වර්ෂාව නිසා හෝ ගබඩා කිරීමේ ගැටළු නිසා මෙම දුර්ගන්ධය හැමිය හැකි බවත්, අවට ප්‍රදේශවාසීන් විසින් මේ සම්බන්ධව දැනුවත් කොට ඇති බවත්, මේ වන විට එම කාබනික පොහොර තරපාල යොදා ගනිමින් වසා දමා ඇති බවත්, ප්‍රකාශ කරන ලද ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් මේ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද යනුවෙන් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

කාබනික පොහොර වලින් දුර්ගන්ධයක් හැමීම සාමාන්‍ය තත්ත්වයක් බවත්, තමා වෙත මෙම ගැටළුව දැන ගැනීමට ලැබුණු පසු තරපාල මිලදී ගෙන කාබනික පොහොර මළු වසා දැමීමට කටයුතු කළ බවත්, මෙම කාබනික පොහොර ජනතාව වෙත ලබා දීමේ කටයුතු මේ වන විට ආරම්භ කොට ඇති බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

(සභාව පැහැදිලි නොවීය.)

2022 ජනවාරි 01 වෙනි දින කලේගාන ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී උදෑසන දානමය පිංකම පැවැත්වෙන බැවින්, ඒ සඳහා සියළුම ගරු සභිකවරුන්ට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ආරාධනා කරන ලදී.

**<u>මහා සභා රැස්වීම සඳහා සහභාගී නොවූ ගරු සභිකවරු</u>**

01. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
03. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
04. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2022-01-19 වන බදාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.